**ශීර්ෂය 259 - මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 259 - මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022දෙසැම්බර් 31 දිනට මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනුලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන, මෙම වාර්තාවේ 1.6 (අ) ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණය අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූප වී නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**ගිණුම්කරණ අඩුපාඩු**

**දේපල පිරියත හා උපකරණ**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණු වෙනත්යන්ත්‍ර හා උපකරණවල අවසාන ශේෂයන්සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආරම්භක ශේෂයන් සමඟ සැසඳීමේදී රු.1,281,996 ක වෙනසක් පැවතුණි. | 2023 අප්‍රේල් 24 දිනැති අංක DSM/ACC/8 දරන ලිපියෙන් මෙම නොසැසදීම පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගැනීමට යොමුකර ඇති බව. | නොසැසඳීම් හඳුනාගෙන ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු ය. |
| (ආ) | මූල්‍ය නොවන වත්කම්වලට අදාළ භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ එකතු කළ මූල්‍ය නොවන වත්කම් ප්‍රමාණය රු.4,156,108ක් වුවද ශේෂ පිරික්සුම අනුව එය රු.4,027,588 ක් වූයෙන් රු.128,520 ක වෙනසක් පැවතුණි. | 2023 අප්‍රේල් 24 දිනැති අංක DSM/ACC/8 දරන ලිපියෙන් මෙම නොසැසදීම පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගැනීමට යොමුකර ඇති බව. | භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනවලශේෂයන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශේෂයන් සමඟ සසඳා ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ඇ) | භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනය අනුව ප්‍රවාහන උපකරණ හා වෙනත් යන්ත්‍ර හා උපකරණ වත්කම් කාණ්ඩය යටතේ ප්‍රවර්තන වර්ෂයේඉවත් කිරීම් රු.4,666,239 ක් වුවද, ශේෂ පිරික්සුම අනු එහි අගය රු.5,740,214 ක් වූයෙන් රු.1,073,975 ක වෙනසක් පැවතුණි. | 2023 අප්‍රේල් 24 දිනැති අංක DSM/ACC/8 දරන ලිපියෙන් මෙම නොසැසදීම පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගැනීමට යොමුකර ඇති බව. | භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශවල ශේෂයන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශේෂ පිරික්සුම සමඟ සසඳා ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ඈ) | ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රු. 17,586,000 ක ගොඩනැගිලි 03 ක් මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදි තක්සේරු වටිනාකම් ලැබුණු සැනින් ගිණුම් ගත කරන බව. | සියලු වත්කම් මූල්‍ය ප්‍රකාශන තුළ නිරූපණය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

**වංචනික ස්වරූපයේ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේ පවිත්‍රතා කටයුතු සඳහා සැපයුම්කාර ආයතනයෙන් සේවය ලබා නොගත් දින සඳහාද රු. 99,356 ක් ගෙවා තිබුණි. | පවිත්‍රතා සේවය ලබාදෙනු ලබන ආයතනය සමඟ ගිවිසුම්ගතවීමේදී මෙවන් තත්ත්වයන්සඳහා අඩුකිරීමට එකඟතාවයක් නොමැති බැවින් අයකරගැනීමක් සිදු කළ නොහැකි බව. | ගෙවීම් කිරීමේදී එක් එක් මාසය තුළ වැඩ කරන දින ගණන පදනම් කර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ එළු පැටවුන් බෙදා දීමේ ව්‍යාපෘතිය මඟින් ප්‍රතිලාභීන් 24 දෙනෙකු වෙත බෙදා දී තිබුණු සතුන් 38 කගෙන් 13ක් මියගොස් තිබුණු අතර තේ පැළ බෙදා දීමේ ව්‍යාපෘතිය මඟින් බෙදා දී තිබුණු පැල 7,000 න් පැල 1428 ක් විනාශවී තිබුණු අතර පැල 1050 ක් රෝපණය කර නොතිබුණි. | අධික සීතල තත්වයෙන් සතුන් මිය ගොස් ඇත. මියගිය සතුන් වෙනුවෙන් රක්ෂණ වන්දි ලබා ගැනීම සඳහා ගොවි රක්ෂණ මණ්ඩලය දැනුවත් කර ඇත.<br><br>තේ පැල නඩත්තුව පිළිබඳව කුඩා තේ වතු අධිකාරියේ ව්‍යාපෘති නිලධාරි මඟින් ප්‍රතිලාභීන් දැනුවත් කර ඇත. මැරුණු පැල වෙනුවට අළුත් පැල සිටුවන ලෙස දන්වා ඇති බව | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ශක්‍යතා වාර්තා පදනම් කරගත යුතු අතර නිවැරදි පසු විපරම් ක්‍රියාවලියක් පවත්වා ගත යුතුය. |

### 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 අප්‍රේල් 07 දින වන විට රු.2,608,000 ක වියදමක් දරා තිබුණු නමුත් තව දුරටත් සිදු කළ යුතු වැඩකොටස් පැවතීම හේතුවෙන් රත්තොට, අඹගස්තැන්න ගම්මිරිස් සැකසුම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල නිෂ්කාර්යයව පැවතුණි. | වැඩ අවසන් කිරීම සඳහා රුපියල් මිලියන 3.17 ක ඇස්තමේන්තුවක් සකස්කර ඇති අතර අදාල මුදල ලැබුණ පසු වැඩ අවසන් කළ හැකි බව. | ඉදිකිරීම් අවසන් කර අරමුණු ගත කාර්යය සඳහා යොදවා ගත යුතුය. |
| (ආ) | වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයවිසින් රු. 413,987ක රජයේ දායකත්වය මත ලග්ගල හා යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ප්‍රතිලාභීන්ට සමාලෝචිත වර්ෂයේජනවාරි සිට ජූනි දක්වා කාලය තුළ ලබා දී තිබුණු ස්වයං රැකියා උපකරණ 06ක් උපයෝගි කරගෙන නිෂ්පාදන කටයුතු සිදුකර නොතිබුණි. | නිෂ්පාදන කටයුතු ආරම්භ නොකරනප්‍රතිලාභීන්ගේ උපකරණ ආපසු ලබාගෙන සුදුසු ප්‍රතිලාභියෙකුට ලබා දීමට කටයුතු කරන බව. | අදාළ උපකරණ අරමුණුගත කාර්යයට යොදවා ගත යුතුය. |
| (ඇ) | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මිනිරන්කැටිය බෑග් හා සපත්තු නිෂ්පාදකයින්ගේ සමිතිය වෙත 2022 ඔක්තෝබර් 03 දින ලබා දී තිබුණු රු. 88,900 ක මුද්‍රණ යන්ත්‍රය හා ග්‍රාම නිළධාරි වසම් 02ක ප්‍රතිලාභීන් සඳහා 2022 ඔක්තෝබර් 03 හා 20 දිනවලදී ලබාදී තිබුණු එකතුව රු. 1,100,000 ක ගම්මිරිස් ඇඹරුම් යන්ත්‍ර 04 ක් හා ගම්මිරිස් එළ කිරීමේ යන්ත්‍ර (Pepper Thresher) 04 ක් 2023 පෙබරවාරි 24 පරීක්ෂණ දිනය වනවිටත් භාවිතයට ගෙන නොතිබුණි. | මුද්‍රණ යන්ත්‍ර සඳහා ප්‍රතිපාදන ලැබීමෙන් පසුව පුහුණුවක් ලබාදී අදාළ යන්ත්‍ර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කිරීම හා ගම්මිරිස් අස්වනු අඩුවීම හේතුවෙන් ඇඹරුම් යන්ත්‍රයේ භාවිතය අවම වී ඇති බැවින් අස්වනු වැඩි කරවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ඉදිරියේදී ගන්නා බව. | අදාළ යන්ත්‍ර උපයෝජනය කිරීමට හැකිවන ලෙස අවශ්‍ය පහසුකම් සලසා දිය යුතුය. |
| (ඈ) | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ලොකුළුණු බීජ නිෂ්පාදකයින් දිරිගැන්වීමේ අරමුණින් 2022 පෙබරවාරි හා මාර්තු යන මාසවල දිගම්පතහ ලොකු ළුණු බීජ නිෂ්පාදන සමිතිය වෙත ලබාදී තිබුණු | යල කන්නයේ දී මෙම භාණ්ඩ භාවිතා කරමින් ලොකු ළුණු හා බීජ නිෂ්පාදන කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කර ඇති බව. | ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| රු.1,246,365 ක වල්කපන යන්ත්‍ර 04 ක් හා කොම්පොස්ට් කැබලි කිරීම් යන්ත්‍ර 03 ක් හා කළුන්දෑව-පරණගම ලොකු ළූණු බීජ නිෂ්පාදන සමිතිය වෙත ලබාදීතිබුණු රු. 444,000 ක කුඩා අත් ට්‍රැක්ටර් 03 ක් 2023 පෙබරවාරි 07 පරීක්ෂණ දිනය වන විටත් නිෂ්කාර්යයව පැවතුණි. | | |

**3.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රත්තොට,ලග්ගල, විල්ගමුව, අඹන්ගගකෝරළේ හා නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ග්‍රාමශක්ති ව්‍යාපාරය සඳහා වසර 04 කට පමණ පෙර ග්‍රාම නිලධාරි වසම් 59 ක සමිති වෙත ලබාදී තිබුණු රු.19,700,715 ක මුදලක් අරමුණුගත කාර්යය සඳහා යොදවා ගැනීමකින් තොරව බැංකු ගිණුම් වල නිෂ්කාර්යයව පැවතුණි. | අක්‍රීය සමිති නැවත සක්‍රීය තත්වයට ගෙන ඒම සඳහා මේ දිනවල කටයුතු කරමින් පවතින බව. | අදාළ අරමුදල් යොදවා අරමුණුගත කාර්යයන් ඉටුකළ යුතුය. |

**3.4 කළමනාකරණ දුර්වලතා**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හිටපු ප්‍රාදේශීය ලේකම්වරියක් ස්ථාන මාරුවී යාමෙන් පසුව 2021 ජනවාරි 11 දින සිට 2022 නොවැම්බර් 29 දක්වා කාලය තුළ ප්‍රාදේශීය ලේකම් උපලේඛනගත නිල නිවාසයේ පදිංචිවී සිටියද එම කාලය සඳහා නිවාස කුලී අයකරගෙන නොතිබුණි. | අයකරගතයුතු මුදලින්රු.29,558 ක් බැගින් වාරික 12කින් අයකර ගන්නා බව. | අදාළ නිවාස කුලී අයකර ගත යුතුය. |

## 4. යහපාලනය

**මහජනයා වෙත සේවා ඉටු කිරිම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි වසම් 09 ක සුළි සුළං තත්වයක් හේතුවෙන් ඇතිවී තිබුණු නිවාස හානි 30 ක් හා වන අලි හානි 06 ක්සඳහාඑකතුව රු.1,782,898 ක වන්දි මුදල් සමාලෝචිත වර්ෂය අවසාන දින වනවිටත් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | 2022 දෙසැම්බර් 31 දින විටත් ප්‍රතිපාදන නොලැබීම මත ගෙවීම් කිරීමට නොහැකි වී ඇති අතර අක්මුදල් ලැබෙන පරිදි ප්‍රමුඛතාවය අනුව ගෙවීම් කටයුතු සිදුකරන බව. | වන්දි මුදල් ගෙවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | 2016 අප්‍රේල් 11 දිනැති අංක 06/2016 දරන කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 4 උප වගන්තියට අනුව ගැබිණි මව්වරුන්ට පෝෂණ දීමනාව ලබාදීමේ ප්‍රාදේශීය මට්ටමේ වගකීම හා අධීක්ෂණය ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පැවරී තිබුණද මාතලේ හා නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ප්‍රතිලාභීන් අවස්ථා 2015කදී එකතුව රු.4,030,000 ක පෝෂණ මල්ල ලබාගෙන නොතිබුණි. | පෝෂණ දීමනාව ලබානොගත් මව්වරුන් පිළිබඳ පසු විපරම් කටයුතු සිදුකරන ලෙස හා එය නොගන්නා අය වේ නම් ඒ පිළිබඳ පෞද්ගලිකව ප්‍රාදේශීය ලේකම් වරුන් සොයා බලා කටයුතු කළයුතු බවට උපදෙස් ලබාදී ඇති බව. | පෝෂණමල්ල ලබා නොගැනීම සම්බන්ධව කරුණු සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු 189 ක් සහ අතිරික්ත 329 ක් පැවතුණි. | කාර්ය මණ්ඩලය බඳවා ගැනීම අමාත්‍යාංශය මඟින් සිදු කරන අතර පුරප්පාඩු පිළිබඳව නිරන්තරයෙන් වාර්තා කරනු ලැබේ. | පුරප්පාඩු හා අතිරිත්තතා සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |